# වාර්ෂික වැඩසටහන් හා කාර්යසාධන වාර්තාව

# 2015

## හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අංක 2481/1, ගාලුපාර, කොළඹ- 04

**බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

අංක 146, ගාලුපාර, කොළඹ - 03

| අංකය | පටුන | පිටු අංකය |
|---|---|---|
| **0.1** | **හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව** | 05 |
| 1.1 | හැඳින්වීම | |
| 1.2 | දැක්ම | |
| 1.3 | මෙහෙවර | |
| 1.4 | අරමුණ | |
| 1.5 | ප්‍රධාන කාර්යයන් | |
| **2.0** | **කාර්යසාධන වාර්තාව** | 06 |
| 2.1 | හැඳින්වීම | |
| 2.2 | වැඩසටහන් සැලැස්ම | |
| **3.0** | **හින්දු දහම් පාසැල් ප්‍රවර්ධනය** | 6-12 |
| 3.1 | අරනෙරි දහම්පාසැල් ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම. | |
| 3.2 | අරනෙරි පාසැල් සිසුන් සඳහා සාමාන්‍ය දැනීම් විභාග පැවැත්වීම | |
| 3.2.1 | "ජාතික එළදායිතා තරගාවලිය" | |
| 3.2.2 | හින්දු ආගමික සාමාන්‍ය දැනීම් විභාගය" | |
| 3.2.3 | "අරුල්නෙරිවිලා" 2015 | |
| 3.3 | හින්දු අරනෙරි ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබාදීම | |
| 3.4 | සංගීත භාණ්ඩ මිලදී ගැනීම හා බෙදාදීම | |
| 3.5 | අරනෙරි දහම් පාසැල් සිසුන් වෙනුවෙන් නිල ඇඳුම් මිලදී ගැනීම | |
| 3.6 | පන්නිසෙ පන්ති | |
| 3.7 | අරනෙරි දහම් පාසැල් සඳහා මූල්‍යාධාර ලබාදීම | |
| 3.8 | අරනෙරි පාසැල් වල සිසුන්ගේ සහය සඳහා පහත සඳහන් ආගමික පොත් මිළදී ගැනීම | |
| 3.9 | අරනෙරි පාසැල් සිසුන් වෙනුවෙන් පොත්, රෙජිස්ටර් හා මාර්ගෝපදේශක පොත් මුද්‍රණය කිරීම / බෙදා දීම | |
| 3.10 | හින්දු තරුණ තරුණියන් වෙනුවෙන් ආධ්‍යාත්මික පුහුණු වැඩසටහන් පැවැත්වීම | |
| **4.0** | **හින්දු ආගමික ප්‍රවර්ධනය** | 13-21 |
| 4.1 | හින්දු ආගමික දේශනා | |
| 4.2 | ගුරුපූජා | |
| 4.3 | හින්දු ආගමික උත්සවයන් | |
| 4.3.1 | තෛපොංගල් උත්සවය | |
| 4.3.2 | මහා ශිවරාත්‍රී උත්සවය | |
| 4.3.3 | අළුත් අවුරුදු උත්සවය | |
| 4.3.4 | නව රාත්‍රී උත්සවය | |
| 4.4 | පුන්‍යග්‍රාම වැඩසටහන | |
| 4.5 | නල්ලූර් නාවලර් මනි මන්ඩපයේ පවත්වන ලද පන්තීන් | |
| 4.6 | හින්දු සංස්කෘතික මධ්‍යස්ථානය, මඩකලපුව | |
| 4.7 | වෙනත් උත්සවයන් | |
| 4.7.1 | අති උතුම් 16 වන ප්‍රැන්සිස් පාප්තුමන්ගේ පැමිණීම | |

| | | | |
|---|---|---|---|
| **5.0** | | **හින්දු ආගමික, සංස්කෘතික දමිළ කලාව** | 22-24 |
| 5.1 | | හින්දු ආගමික පර්යේෂණ සම්මන්ත්‍රණ | |
| | 5.1.1 | මඩකලපුවේ තිරුමුරෛ සමුළුව | |
| | 5.1.2 | පර්යේෂණ රචනා 20ක් එක්කොට අත්පොතක්, සම්මන්ත්‍රණ විශේෂ පොත, ලංකාවේ භාවිතයේ ඇති වචන, හින්දු ලිත, පන්පාඩු යන පොත් එළිදැක්වීම | |
| 5.2 | | සංස්කෘතික පන්ති පැවැත්වීම | |
| 5.3 | | ශිල්ප හා වාස්තු විද්‍යාව පිළිබඳ සම්මන්ත්‍රණ | |
| 5.4 | | පර්යේෂණ රැස්වීම් හා සාකච්ඡා | |
| **6.0** | | **හින්දු දමිළ කලා ප්‍රවර්ධනය** | 25 |
| 6.1 | | ශ්‍රී ලාංකික කතෘවරුන්ගෙන් පොත් මිලදී ගැනීම | |
| 6.2 | | ගැමිකලා ප්‍රවර්ධනය | |
| 6.3 | | කලාභූෂණ සම්මාන උළෙල 2015 | |
| **7.0** | | **හින්දු කෝවිල් හා ආයතන ප්‍රවර්ධනය** | 26-30 |
| 7.1 | | මූල්‍ය ප්‍රාග්ධන යටතේ හින්දු කෝවිල් සඳහා ආධාර ලබාදීම | |
| | 7.1.1 | හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම (උතුර) | |
| | 7.1.2 | හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය (නැගෙනහිර) | |
| | 7.1.3 | හින්දු කෝවිල්, ආයතන ප්‍රතිසංස්කරණය (උතුර, නැගෙනහිර හැර) | |
| | 7.1.4 | හින්දු කෝවිල්වල යටිතල පහසුකම් | |
| 7.2 | | ප්‍රාග්ධන වියදම යටතේ කෝවිල්වලට ආධාර ලබාදීම | |
| | 7.2.1 | හින්දු කෝවිල්වලට කුම්භාභිෂේක යන විශේෂ උත්සවයට ආධාර | |
| | 7.2.2 | හින්දු ළමා හා වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | |
| | 7.2.3 | නන්දිකොඩි මුද්‍රණය කිරීම හා බෙදාහැරීම | |
| **8.0** | | **හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව** | 31-34 |
| 8.1 | | මූල්‍ය ප්‍රගතිය 2015 | |
| 8.2 | | අංශ වශයෙන් මූල්‍ය ප්‍රගති වාර්තාව 2015 | |
| 8.3 | | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති හින්දු කෝවිල්, හින්දු ආගමික ආයතන, හින්දු අරනෙරි දහම් පාසැල් | |
| 8.4 | | අනුමත කාර්යමණ්ඩලය - (2015.01.01 දින සිට 2015.12.31 දක්වා) | |
| **9.0** | | **හින්දු සංස්කෘතික අරමුදල** | 35-36 |
| 9.1 | | හැඳින්වීම | |
| 9.2 | | මූල්‍ය තත්ත්වය | |
| 9.3 | | හින්දු සංස්කෘතික අරමුදල - ප්‍රගති 2015 | |
| **10.0** | | **දෙපාර්තමේන්තුවේ විජයග්‍රහනයන්** | 37-38 |
| 10.1 | | ජාතික ඵලදායිතා සම්මානය 2014 | |
| 10.2 | | ජාතික ඵලදායිතා සම්මාන ඇගයීම් උත්සවය | |

## අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



1989 වර්ෂයේ ආරම්භ කරන ලද හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුල හින්දු ආගම හා සංස්කෘතිය ආරක්ෂා කිරීම, සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්ත කිරීම හා හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම ආදිය දීර්ඝකාලින ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරමින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතියි.
දෙපාර්තමේන්තුව තම ක්රියාවන් ඔප්නැංවීම සදහා ISO – 9001 තත්ත්ව පාලන ප්‍රමිතිය ප්‍රායෝගික කිරීම තුලින් ඵලදායිතාව වර්ධනය කිරීමෙන් 2015 දි සේවා ඵලදායිතාව හා ශ්‍රේණිය වර්ධනය කර ඇත. දක්ෂතම නායකත්වය හා සියළුම නිලධාරින්ගේ කැපකිරීමෙන් හා පරිත්‍යාගශීලිත්වයෙන් මෙම උසස් තත්ත්ව ප්‍රමිති සහතිකය ලබාගැනීමට හැකිවිය.

2015 වර්ෂයේදි දක්නට ලැබුණු රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව අප දෙපාර්තමේන්තුව මගින් බලාපොරොත්තුවු සහයෝගය කාර්යක්ෂම ඵලදායිතාව කරා ළගාවීමට හැකිවූ බව අභිමානයෙන් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. වර්ෂයේ දින 365 දි අප විසින් ඉටුකරනු ලබන ක්‍රියාවන් මෙහිදි සදහන් කිරීම අපහසුවක් ලෙස දැනුනද පාලන හා ගිණුම් ක්‍රියාකාරි ධාරිතා කෙටියෙන් සදහන් කිරීමට උත්සහයක් ගෙන ඇත.

මෙම මොහොතේදි අප දෙපාර්තමේන්තුවේ කටයුතු සදහා දායකත්වය හා සහයෝගය ලබාදුන් සියලුදෙනාට විශේෂයෙන් ගරු අමාත්‍යවරුන්, ගරු පාර්ලිමේන්තු සභිකයින්, ගරු පළාත් සභා මන්ත්‍රිවරුන්, රාජ්‍ය ආයතන හා හින්දු තාපස පූජකවරුන්, හින්දු ආයතන, අරනෙරි දහම් පාසැල් ඇතුළු සියලු කොටස්කරුවන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පළකිරීමට කැමැත්තෙමි.

අප දෙපාර්තමේන්තුවේ වගකීම් ජයග්‍රාහී ලෙස අපගේ උත්සහය තුලින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා සියලුම නිලධාරින්ගේ සහයෝගයද ලබාගැනීමට හැකිවීම ගැන අප ඉමහත් සතුටට පත්වන බැවින්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු නිලධාරින්ට ඔවුන්ගේ කැපකිරීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුදකරමි.

2015 වර්ෂයේදි අප ඉලක්කයට ලඟාවීමට සහයෝගය ලබාදුන් දෙපාර්තමේන්තුවේ කළමණාකරන නිලධාරින් ඇතුළු අනෙකුත් සියළුම දෙනාගේ සේවාව අගය කරන්නෙමි. ඔවුන් මාගේ ස්තූතිය ලබන්නට සුදුසු බවේ කිසිදු සැකයක් නැත.

ඒ. උමාමහේෂ්වරන්,
අධ්‍යක්ෂ

# 1.0 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ හින්දු ආගම හා සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් 1986 ජනවාරි 01 වැනි දින හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදි.

## 1.2 දැක්ම

හින්දු ආගම හා සංස්කෘතිය සුරැකීම හා මනා ලෙස පිහිටුවීම.

## 1.3 මෙහෙවර

හින්දු ආගම, හින්දු අධ්‍යාපනය, හින්දු සංස්කෘතිය හා කලාවන් සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්ත කිරීම හා හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම.

## 1.4 අරමුණු

- සිසුන් වෙනුවෙන් ආගමික වටිනාකම් සහ සදාචාරය වර්ධනය කිරීම සඳහා හින්දු ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
- හින්දු ආගමික කටයුතු ප්‍රවර්ධනය හා හින්දු ආගමට ආවේනික සිරිත්විරිත් පවත්වාගෙන යෑම
- හින්දු ආගම හා සංස්කෘතිය පිළිබඳව පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම
- හින්දු ආගමික කලාව සහ ශිල්පීන්ගේ නිර්මාණය සඳහා පොදු ජනතාව අතර උසස් මතයක් ඇති කිරීම.

## 1.5 ප්‍රධාන කාර්යයන්

- හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය
- හින්දු පූජකවරුන් සඳහා පුහුණු සැපයීම
- හින්දු පූජකවරුන් සිහිපත් කිරීමේ අරමුණින් විශේෂ පූජාවන් පැවැත්වීම, හින්දු ආගමික දේශනා හා පාරම්පරික සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම.
- හින්දු අරනෙරි දහම් පාසැල්වල හින්දු ආගම ප්‍රවර්ධනය කිරීම හා ආගමික සාරධර්ම ප්‍රවර්ධනය කිරීම
- හින්දු විශ්වකෝෂය සංරක්ෂණය කිරීම
- හින්දු පර්යේෂණ පුස්තකාල පාලනය
- හින්දු ආගමික හා සංස්කෘතික පර්යේෂණය
- හින්දු ආගමික කලාව හා දමිළ කලාව සංරක්ෂණය කිරීම
- කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ පාලනය
- මඩකලපුව හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පාලනය
- යාපනයේ ආනෛපන්දි කුරුකුලම් ගොඩනැගිල්ලේ කළමණාකරනය
- යාපනයේ නාවලර් මනි මණ්ඩපයේ පාලනය
- හින්දු කලාව හා සංස්කෘතිය සංරක්ෂණය කිරීම
- හින්දු සංස්කෘතික අරමුදල් පනත ක්‍රියාත්මක කිරීම

## 2.0 කාර්ය සාධන වාර්තාව

**2015.01.01 සිට 2015.12.31 දක්වා**

2.1 හැදින්වීම

සාරධර්මයෙන් පිරි සමාජයක් ගොඩනැගීමට රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවන ලද වැඩසටහන්

2.2 **වැඩසටහන් සැලැස්ම**

- **I.** හින්දු අරනෙරි දහම් පාසැල් ප්‍රවර්ධනය
- **II.** හින්දු ආගම ප්‍රවර්ධනය කිරීම
- **III.** හින්දු ආගමික සංස්කෘතික පර්යේෂණය
- **IV.** හින්දු ආගම, දමිළ කලාව, සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම
- **V.** හින්දු කෝවිල් හා හින්දු ආයතන සංවර්ධනය කිරීම

2015 දෙසැම්බර් මස 31 දින දක්වා දෙපාර්මේන්තුව මගින් පහත සදහන් ව්‍යාපෘති සම්පූර්ණ කර ඇත.

## 3.0 හින්දු දහම් පාසැල් ප්‍රවර්ධනය

හින්දු දහම් පාසැල් සිසුන්ගේ මනසේ සාරධර්ම, යහ ගුණාංග වැඩිදියුනු කිරීම, විශ්වාසයෙන් දෙවියන් යැදුම්පිදුම් කිරීමට මගපෙන්වීම, ආගමික දැනීම වර්ධනය කිරීමට අවශ්‍ය නිසි මාර්ගය පෙන්වාදී සාරධාර්මයෙන් පිරි සමාජයක් ගොඩනැගීම හින්දු අරනෙරි අධ්‍යාපනයේ මූලික අරමුනයි.

අධ්‍යාපනයට පමණක් නොව එය ක්‍රියාවටද නංවිය යුතුයි යන තෝමාව යටතේ යහපත් ගුණාංග වඩවීමට අරනෙරි අධ්‍යාපන ඉමහත් ලෙස වෙහෙසක් දරනු ඇත. එම ගුණාංග වඩවීමට අවහිරව ඇති සියලුම දෑ ඉවත් කර අනීතිය, බොරුව, ඊර්ෂියාව, අපිලිවෙල, අසාරධර්ම යනාදිය කරුණු ළමුන් තුල ඇතිවීමට මූලික කරුණු සොයා එවැනි කටයුතු වලින් මිදි සිටීමට ක්‍රියාමාර්ග යෙදීමට හින්දු අධ්‍යාපනය මූලිකත්වය දෙනු ඇත.

මෙම ක්‍රියාවන් වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව මගින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි. ගුරුවරුන් සදහා සම්මන්ත්‍රණ පැවැත්වීම, අරනෙරි දහම් පාසැල් වෙනුවෙන් තරග පැවැත්වීම, අරනෙරි දහම් පාසැල් වෙනුවෙන් පොත් ලබාදීම, සිසුන්ට නිලඇදුම් ලබාදීම, අරනෙරි දහම් පාසැල්වල යටිතල පහසුකම් සපුරාලීමට භාණ්ඩ ලබාගැනීම ආධාර ලබාදීම ආදිය මෙම අංශයේ ප්‍රධාන ව්‍යාපෘතින්ය.



## 3.1 අරනෙරි දහම්පාසැල් ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.

අරනෙරි දහම් පාසැල් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රමවේදය ක්‍රමවත් කිරීමත්, විෂය නිර්දේශවල පදනම පැහැදිලි කිරීමට හා සිසුන්ට ප්‍රායෝගික අධ්‍යාපනය ලබාදීමටත් දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණු සම්මන්ත්‍රණ පවත්වනු ඇත.

**2015 දෙසැම්බර් මස 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ**

- ❖ ලියාපදිංචි කර ඇති දහම්පාසැල් සංඛ්‍යාව - 1,999
- ❖ අරනෙරි දහම්පාසැල් සිසුන් සංඛ්‍යාව - 191,774
- ❖ අරනෙරි දහම්පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව - 9,756

*3 - I සටහන*

**ලියාපදිංචි හින්දු දහම් පාසැල් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2015 ලියාපදිංචි කර ඇති හින්දු දහම් පාසැල් පිළිබඳ තොරතුරු | | | 1986 වර්ෂයේ සිට 2015 දක්වා ලියාපදිංචි කර ඇති හින්දු දහම් පාසැල් පිළිබඳ තොරතුරු | | |
|---|---|---|---|---|---|---|---|
| | | පාසැල් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව | ගුරුවරුන් සංඛ්‍යාව | පාසැල් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව | ගුරුවරුන් සංඛ්‍යාව |
| 1 | කොළඹ | 2 | 84 | 4 | 94 | 10,514 | 807 |
| 2 | අම්පාර | 3 | 170 | 12 | 117 | 17,103 | 958 |
| 3 | මඩකලපුව | 15 | 1,762 | 65 | 234 | 30,218 | 1560 |
| 4 | මහනුවර | 7 | 499 | 17 | 152 | 20,037 | 545 |
| 5 | නුවරඑළිය | 15 | 1,133 | 41 | 156 | 14,663 | 583 |
| 6 | කෑගල්ල | 3 | 141 | 4 | 85 | 4,683 | 222 |
| 7 | බදුල්ල | 7 | 468 | 22 | 174 | 17,010 | 1021 |
| 8 | වවුනියා | 8 | 278 | 14 | 79 | 6,101 | 429 |
| 9 | පුත්තලම | 0 | - | - | 45 | 2,534 | 198 |
| 10 | ගම්පහ | 1 | 148 | - | 13 | 2,203 | 42 |
| 11 | ත්‍රිකුණාමලය | 7 | 212 | 73 | 115 | 13,138 | 681 |
| 12 | රත්නපුර | 3 | 187 | 10 | 110 | 12,272 | 317 |
| 13 | මාතලේ | 3 | 160 | 4 | 57 | 7,421 | 198 |
| 14 | යාපනය | 14 | 515 | 31 | 259 | 18,345 | 1130 |
| 15 | කිලිනොච්චිය | 3 | 145 | 6 | 72 | 5,514 | 198 |
| 16 | මුලතිව් | 11 | 465 | 20 | 58 | 5,069 | 271 |
| 17 | කළුතර | 6 | 152 | 10 | 60 | 1,302 | 202 |
| 18 | කුරුණෑගල | 1 | - | 2 | 10 | 143 | 36 |
| 19 | අනුරාධපුර | 0 | - | - | 1 | 363 | 5 |
| 20 | මොණරාගල | 0 | - | - | 5 | 121 | 15 |
| 21 | ගාල්ල | 0 | - | - | 8 | 346 | 12 |
| 22 | මන්නාරම | 3 | 198 | 14 | 75 | 1,053 | 272 |
| 23 | පොලොන්රුව | 0 | 0 | 0 | 6 | 968 | 23 |
| 24 | මාතර | 0 | 0 | 0 | 14 | 653 | 31 |
| එකතුව | | **112** | **6,717** | **349** | **1,999** | **191,774** | **9,756** |

*3 - II – සටහන*

| අනු අංකය | වැඩසටහනේ නම | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 01. | ධර්මාචාර්ය නේවාසික සම්මන්ත්‍රණ 03 ක් පවත්වා ඇත. | අම්පාර, කෑගල්ල, කළුතර, රත්නපුර, පොලොන්නරුව, මන්නාරම | ධර්මාචාර්ය ගුරුවරුන් 387 දෙනෙකු |
| 02. | අරනෙරි ගුරුවරුන් සඳහා ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳ සම්මන්ත්‍රණ 06 පවත්වා ඇත. | බදුල්ල, අම්පාර, පොලොන්නරුව, නුවරඑළිය, යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, මහනුවර, මාතලේ, කොළඹ, ගම්පහ, මාතර, කළුතර, පුත්තලම, කුරුණෑගල,රත්නපුර, කෑගල්ල | හින්දු අරනෙරි දහම් පාසැල් ගුරුවරුන් 1315 දෙනෙකු. |
| 03. | අරනෙරි ගුරුවරුන්ගේ අවසාන විභාගය පිළිබඳ සම්මන්ත්‍රණ 06 ක් පවත්වා ඇත. | කොළඹ, ගම්පහ, වවුනියා, පුත්තලම | හින්දු අරනෙරි දහම් පාසැල් ගුරුවරුන් 460 දෙනෙකු. |
| 04 | අරනෙරි ගුරුවරුන් වෙනුවෙන් පවත්වන සහතික පත්‍ර පාඨමාලාව | යාපනය, මඩකලපුව | හින්දු අරනෙරි දහම් පාසැල් ගුරුවරුන් 380 දෙනෙකු. |

**01-** රූප



අරනෙරි දහම් පැසැල් ගුරුවරුන් සඳහා නාවට්කුඩා හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේදී පවත්වන ලද නේවාසික සම්බන්ත්‍රණය



අරනෙරි දහම් පැසැල් ගුරුවරුන් සඳහා කොළඹ රාමක්‍රිෂ්ණ මිෂන් මණ්ඩපයේදී පවත්වන ලද නේවාසික සම්මන්ත්‍රණය



අරනෙරි දහම් පැසැල් ගුරුවරුන් සඳහා කොළඹ රාමක්‍රිෂ්ණ මිෂන් මණ්ඩපයේදී පවත්වන ලද ධර්මාචාර්ය සම්මන්ත්‍රණය



අරනෙරි ගුරුවරුන් සඳහා යාපනයේදී පැවැත්වුනු සම්මන්ත්‍රණය

### 3.2 අරනෙරි පාසැල් සිසුන් සඳහා සාමාන්‍ය දැනීම් විභාග පැවැත්වීම

**මෙම ව්‍යාපෘතිය සඳහා රු මිලි 4.40 වැය කර ඇත.**

### 3.2.1 ජාතික ඵලදායිතා තරඟාවලිය

අරනෙරි සිසුන්ගේ කාලය ඉහළනැංවීමේ අරමුණින් කථික, නර්තන, පන්නිසෛ, විල්ලුපාට්ටු, රචනාව, නාට්‍ය ආදිය අංශවලින් ඵලදායිතා තරඟාවලිය ජාතික මට්ටමින් අරනෙරි දහම් පාසැල් අතරින් 2015 වර්ෂයේ සිට ආරම්භ කර පවත්වා ගෙන යමින් පවතී. එම තරඟවලින් තෝරාගන්නා ලද සිසුන්ද දිස්ත්‍රික්ක මට්ටමින් සහභාගී වී ජයග්‍රහණය ලැබූ සිසුන්ද ජාතික මට්ටමින් සහභාගී විය. ජාතික මට්ටමින් පළමු ස්ථානය, දෙවන ස්ථානය හා තෙවන ස්ථානය ලබාගත් සිසුන් සඳහා සම්මාන, ත්‍යාග හා සහතික පත්‍ර දී ගෞරවය කරනු ලැබීය.

### 3.2.2 හින්දු ආගමික සාමාන්‍ය දැනීම් විභාගය

ජාතික මට්ටමින් පවත්වන ලද හින්දු ආගමික සාමාන්‍ය දැනීම් විභාගය 2006 වර්ෂයේ සිට වාර්ෂිකව මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබයි. 2 වසරේ සිට 11 වන වසර දක්වා ඉගෙනුම ලබන සිසු සිසුවියන්ගේ ආගමික දැනුම වර්ධනය කිරීම, ඇගයීම, පෞරුෂ වර්ධනය ආදිය දියුණු කිරීමේ අරමුණින් පාසැල් විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සංවර්ධන නිලධාරින්ගේ සහයෝගයෙන් ජාතික මට්ටමින් සැප්තැම්බර් මස 26 වැනි දින සිසුන් 77,000 ක් සමඟ විභාග මධ්‍යස්ථාන 183 ක විභාගය පැවැත්වනු ලැබීය.

ඒ අනුව ඉහත විභාගයේ සමත් වූ සිසුන් හා ඵලදායිතා තරඟාවලියේ ජයග්‍රහනය ලැබූ සිසුන් 273 දෙනෙකු සඳහා ත්‍යාග ප්‍රදානෝත්සවය 2016.02.27 වැනි දින පුදිය කදිරේෂන් ශාලාවේදී බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමාගේ සහභාගීත්වයෙන්, අමාත්‍යාංශයේ ලේකම් වි. සිවඥාණසෝදි මහතාගේ නායකත්වයෙන් පවත්වන ලදි.

### 3.2.3 "අරුල්නෙරිවිලා" උත්සවය - 2015

නල්ලූර් කෝවිලේ උත්සවය නිමිත්තෙන් හින්දු දහම්පාසැල් සිසුන්ගේ දක්ෂතාවයන් වැඩිදියුණුකිරීමේ අරමුණින් පවත්වන ලද ඵලදායිතා තරඟාවලියෙන් ජයග්‍රහනය ලැබූ සිසුන් සඳහා ත්‍යාග ප්‍රදානෝත්සවය 2015.12.27 වැනි දින යාපනය ඉලංගෙෙ වේන්දන් විද්‍යාලයේදි පවත්වන ලදි.








යාපනය ඉලංගෙෙ වේන්දන් කලාවිද්‍යාලයේ "අරුල්නෙරි උත්සවය" 2015 ත්‍යාග ප්‍රදානෝත්සවයේදි

## 3.4 හින්දු අරනෙරි ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබාදීම

අරනෙරි ගුරුවරුන්ගේ දැනීම වර්ධනය කිරීම සඳහා පොත් මිලදී ගැනීමට වාර්ෂිකව රු 3400/= පුස්තකාල දීමනාවක් ලබාදෙනු ඇත. ඒ අනුව මෙම වර්ෂයේදී දිස්ත්‍රික්ක 22 ක හා වෙනත් දිස්ත්‍රික්ක වල සිටින ගුරුවරුන් 3498 දෙනෙකු සඳහා මෙම දීමනාව ලබාදී ඇත.

*3 - III – සටහන*

ගුරුවරුන්ගේ පුස්තකාල දීමනාව - 2015

| අනු අංක | දිස්ත්‍රික්කය | ගුරුවරුන් සංඛ්‍යාව | බෙදාදුන් මුදල් සංඛ්‍යාව රුපියල් |
|---|---|---|---|
| 1 | කොළඹ | 180 | 612,000.00 |
| 2 | අම්පාර | 414 | 1,407,600.00 |
| 3 | මඩකලපුව | 719 | 2,444,600.00 |
| 4 | මහනුවර | 193 | 656,200.00 |
| 5 | නුවරඑළිය | 107 | 363,800.00 |
| 6 | මන්නාරම | 107 | 363,800.00 |
| 7 | බදුල්ල | 187 | 635,800.00 |
| 8 | කිලිනොච්චි | 64 | 217,600.00 |
| 9 | ගම්පහ | 16 | 54,400.00 |
| 10 | මාතලේ | 95 | 323,000.00 |
| 11 | රත්නපුර | 104 | 353,600.00 |
| 12 | ත්‍රිකුණාමලය | 191 | 649,400.00 |
| 13 | යාපනය | 391 | 1,329,400.00 |
| 14 | කළුතර | 59 | 200,600.00 |
| 15 | පොලොන්නරුව | 46 | 156,400.00 |
| 16 | ගාල්ල | 20 | 68,000.00 |
| 17 | මාතර | 13 | 44,200.00 |
| 18 | කුරුණෑගල | 4 | 13,600.00 |
| 19 | කෑගල්ල | 75 | 255,000.00 |
| 20 | පුත්තලම | 68 | 231,200.00 |
| 21 | වවුනියා | 61 | 207,400.00 |
| 22 | මුලතිව් | 98 | 333,200.00 |
| 23 | වෙනත් | 286 | 572,000.00 |
| | **එකතුව** | **3498** | **11,492,800.00** |

## 3.4 සංගීත භාණ්ඩ මිලදී ගැනීම හා බෙදාදීම

මෙම වර්ෂයේ දහම් පාසැල්වලට ලබාදීම සඳහා සුරුදි පෙට්ටි 97 ක් හා තාලම් 97 රුපියල් මිලියන 0.05 ක වියදමින් මිලදී ගෙන එයින් අම්පාර දිස්ත්‍රික්කයේ ඇති හින්දු දහම්පාසැල් 31කට හා මුලතිව් දිස්ත්‍රික්කයේ එක් පාසැලකටද ආදි වශයෙන් පාසැල් 32ක් සඳහා බෙදා දී ඇත.

## 3.5 අරනෙරි දහම් පාසැල් සිසුන් වෙනුවෙන් නිල ඇඳුම් මිලදී ගැනීම

මෙම දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව අරනෙරි දහම් පාසැල් සිසු සිසුවියන් සඳහා නොමිලේ නිළ ඇඳුම් ලබාදෙනු ලැබේ. ඒ අනුව පිරිමි ළමුන් සඳහා නිළ ඇඳුම් කට්ටල 10,213ක් හා ගැහැණු ළමුන් සඳහා නිළ ඇඳුම් කට්ටල 16,310 බැගින් සිසුන් 26,523 දෙනෙකු සඳහා රුපියල් මිලියන 14.98ක වියදමින් ගෙන්වන ලදි.

## 3.6 පන්නිසෛ පන්ති

හින්දු අරනෙරි දහම් පාසැල් සිසුන්ගේ පන්නිසෙෙ ගැයීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව දිස්ත්‍රික්ක මට්ටමින් පන්ති පවත්වනු ලැබේ. මෙම වර්ෂයේ කළුතර, යාපනය, මඩකලපුව, බදුල්ල, අම්පාර, පුත්තලම ආදිය දිස්ත්‍රික්කවල පන්ති 521 ක් පවත්වා ඇත.

*3 - IV – සටහන*

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ පන්ති වාර ගණන | මුදල රුපියල් | සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | පැය ගණන |
|---|---|---|---|---|---|
| 1 | කළුතර | 77 | 28,000 | 30 | 146 |
| 2 | යාපනය | 208 | 52,000 | 68 | 256 |
| 3 | මඩකලපුව | 134 | 40,750 | 60 | 326 |
| 4 | අම්පාර | 66 | 9,000 | 30 | 72 |
| 6 | බදුල්ල | 25 | 28,000 | 30 | 60 |
| 7 | පුත්තලම | 11 | 7,000 | 25 | 60 |
| | මුළු ගණන | **521** | **164,750** | **188** | **920** |

## 3.7 අරනෙරි දහම් පාසැල් සඳහා මූල්‍යාධාර ලබාදීම

අරනෙරි දහම් පාසැල්වලට අවශ්‍ය භාණ්ඩ (මේස, පුටු) ලබාදීම සඳහා රුපියල් මිලියන 1.5 ක වියදමින් දිස්ත්‍රික්ක 10 පිහිටි දහම් පාසැල් 50 ක් සඳහා ආධාර ලබාදී ඇත.

*3 - V – සටහන*

| අනු අංකය | දිස්ත්‍රික්කය | අරනෙරි පාසැල් සංඛ්‍යාව | මුදල රුපියල් | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 1 | යාපනය | 12 | 360,000 | 520 |
| 2 | මඩකලපුව | 13 | 390,000 | 600 |
| 3 | ත්‍රිකුණාමලය | 9 | 270,000 | 520 |
| 4 | මහනුවර | 1 | 30,000 | 50 |
| 5 | කළුතර | 1 | 30,000 | 30 |
| 6 | බදුල්ල | 5 | 150,000 | 240 |
| 7 | වවුනියා | 1 | 30,000 | 45 |
| 8 | මුලතිව් | 3 | 90,000 | 250 |
| 9 | පුත්තලම | 4 | 120,000 | 120 |
| 10 | කිලිනොච්චි | 1 | 30,000 | 35 |
| | මුළු එකතුව | **50** | **1,500,000** | **2410** |

3.8 අරනෙරි පාසැල් වල සිසුන්ගේ සහය සඳහා පහත සඳහන් ආගමික පොත් මිළදී ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් රුපියල් මිලියන 0.34 වියදමින් ආගමික, දැනුම පදනම්කරගත් පොත් මිළදී ගෙන ශ්‍රී ලංකාවේ පිහිටි සියළුම අරනෙරි දහම් පාසැල් සඳහා බෙදා දී ඇත.

- ❖ අරනෙරි අමුදම් - පිටපත් 3,000
- ❖ ඉන්දු සමයත්තින් සීර්තිරුත්ත ඉයක්කංගල් - පිටපත් 500
- ❖ අවසාන විභාග ප්‍රශ්ණ පත්‍ර - පිටපත් 200
- ❖ බක්ති යෝගම් - පිටපත් 100
- ❖ කර්ම යෝගම් - පිටපත් 70
- ❖ බගවත් ඥාණතුලිගල් - පිටපත් 40
- ❖ කඩල් කන්නි - පිටපත් 200
- ❖ ජේසුම් ජේනා - පිටපත් 200
- ❖ Garden of life (3,5,7 ශ්‍රේණි ) - පිටපත් 03
- ❖ අච්චයාර් අරිවුච් වෙල්වම් - පිටපත් 23
- ❖ පැමිණීමේ ලේඛණ - පිටපත් 1137
- ❖ පන්නිරුත්තිරුමුරෙ තෝත්තිරප්පාඩල් - පිටපත් 05
- ❖ ආගමික නායකයින්ගේ පින්තූරු - පිටපත් 04
- ❖ ධර්මාචාර්ය ප්‍රශ්ණපත්‍ර - පිටපත් 565
- ❖ ආන්මීග මංගලම් - පිටපත් 37
- ❖ වෙනත් ආගමික පොත් - පිටපත් 964

3.9 අරනෙරි පාසැල් සිසුන් වෙනුවෙන් පොත්, රෙජිස්ටර් හා මාර්ගෝපදේශක පොත් මුද්‍රණය කිරීම / බෙදා දීම

අරනෙරි පාසැල්වල සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා රුපියල් මිලියන 0.03 වියදමින් පහත සඳහන් පොත් මුද්‍රණය කරන ලදි.

**මුද්‍රණය කරනලද පොත්**

- ❖ සෛවපෝදිනි - පිටපත් 578
- ❖ පන්නිරු තිරුමුරෙ තෝත්තිරතිරට්ටු - පිටපත් 896
- ❖ පැමිණීමේ ලේඛණ - පිටපත් 2788
- ❖ ආසිරියර් කෛයේඩු - පිටපත් 1752
- ❖ ඉන්දු මක්කලුක්කු ඔරු කෛයේඩු - පිටපත් 293
- ❖ විෂය නිර්දේශ - පිටපත් 1373
- ❖ අච්චයාර් අරිවුච් වෙල්වම් - පිටපත් 2061
- ❖ අරනෙරි අමුදම් - පිටපත් 1589
- ❖ සෛව කෝවිල්කලුම් මනිද උඩලුම් - පිටපත් 157
- ❖ නිත්තිය වලිපාට්ටු තෝත්තිරම් - පිටපත් 83
- ❖ අවසාන විභාග ප්‍රශ්ණ පත්‍ර - පිටපත් 192
- ❖ සෛවසමයම් - පිටපත් 277
- ❖ වේදංගලුම් ආගමංගලුම් - පිටපත් 262
- ❖ පන්නිරුත් තිරුමුරෙ - පිටපත් 205
- ❖ සමය ඥාණිගලුම් පෙරියාර්ගලුම් - පිටපත් 231
- ❖ ඉන්දු නාගරිගම් - පිටපත් 38
- ❖ නව විෂය නිර්දේශයට අනුව විෂය පොත් මුද්‍රණය කර ඇත.

3.10 හින්දු තරුණ තරුණියන් වෙනුවෙන් ආධ්‍යාත්මික පුහුණු වැඩසටහන් පැවැත්වීම

හින්දු තරුණ තරුණියන්ගේ ආධ්‍යාත්මික ගුණාංග හා නායකත්වය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව මෙම වැඩසටහන පවත්වනු ඇත. මෙම වර්ෂයේ පෙබරවාරි මස 14,15 දිනවල රුපියල් මිලියන 0.175 වියදමින් ගාල්ල, කළුතර දිස්ත්‍රික්කවල සිටින හින්දු තරුණ තරුණියන් වෙනුවෙන් කොළඹ රාමක්‍රිෂ්ණ ශාලාවේදි මෙම වැඩසටහන පවත්වා ඇත. මෙම පුහුණුවට 75 දෙනෙකු සහභාගී විය.

## 4.0 හින්දු ආගමික ප්‍රවර්ධනය

හින්දු සංස්කෘතික හා ආගමික උත්සවයන් දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් ලබාදෙමින් දිස්ත්‍රික්කවල උත්සවයන් සංවිධානය කරනු ඇත.

### 4.3 හින්දු ආගමික දේශනා

කෝවිලවල හා හින්දු ආගමික ආයතනවල හින්දු ආගමික දේශකයින් විසින් මෙම දේශනා පවත්වනු ඇත. මෙතෙක් යාපනය, පුත්තලම, මඩකලපුව, රත්නපුර, මාතලේ, මහනුවර, අම්පාර, බදුල්ල, කොළඹ, නුවරඑළිය, මුලතිව්, කිලිනොච්චිය, කළුතර, ගාල්ල යන දිස්ත්‍රික්ක 14 ක රුපියල් මිලියන 0.114 ක වියදමින් දේශනා 136 ක් පවත්වා ඇත. එමගින් හින්දු 8000 කට වැඩි පිරිසක් ප්‍රයෝජනය ලබා ඇත.

*රූප III*



2015.02.20 දින මාන්දෛ බටහිර ඉලුප්පෛකඩවෛ මුනියප්පර් කෝවිලේ පැවැති ආගමික දේශනය



2015.02.22 දින මන්නාරම, උප්පුකුලම සිත්තිවානායගර් කෝවිලේදි පැවැති ආගමික දේශනය



2015.03.15 දින මහනුවර ආදිත්‍යා අරනෙරි පාසලේදි පැවැත්වූ දේශනය



2015.03.15 දින මන්නාරම ආණ්ඩාන්කුලම් පිල්ලයාර් කෝවිලේදි පැවැති ආගමික දේශනය

### 4.4 ගුරුපූජා

හින්දු ආගමික නායන්මාර්වරුන් සිහිපත් කරමින් කෝවිල්වල විශේෂ පූජාවන් පවත්වනු ඇත. මෙම වර්ෂයේ යාපනය, ගාල්ල, රත්නපුර, කොළඹ, බදුල්ල, නුවරඑළිය, මුලතිව්, මහනුවර, ත්‍රිකුණාමලය, මන්නාරම, අම්පාර, මඩකලපුව, මාතලේ, ගම්පහ, පුත්තලම, පොලොන්නරුව යන දිස්ත්‍රික්ක 16 ක රුපියල් 0.391 ක වියදමින් ගුරුපූජාවන් 122ක් පවත්වා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්ත කර ඇති සංවර්ධන නිල ධාරින්ගේ සහයෝගයෙන්, හින්දු ආගමික ආයතනවල අනුග්‍රහයෙන් සංවිධානය කර ඇත. මෙයින් 7500 දෙනෙකුට වැඩි පිරිසක් ප්‍රයෝජනය ලබා ඇත.

*රූප IV*

හින්දු ආගමික නායන්මාර්වරුන්ගේ ගුරුපූජාවන්



මහනුවරදි පැවැති තිරුවල්ලුවර් ගුරුපූජාව



තෙල්ලිපලෛ නීලියම්මන් පිල්ලයාර් කෝවිලේදි පැවැති කන්නප්ප නායනාර් ගුරුපූජාව



මුලතිව්හිදි පැවැති කාරෛකාල් අම්මයාර් ගුරුපූජාව



පොතුවිල්හිදි පැවැත්වූ කන්නප්ප නායනාර් ගුරුපූජාව

## 4.5 හින්දු ආගමික උත්සවයන්

හින්දු ආගමික උත්සවයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2015 වර්ෂයේ රුපියල් 1.063 වියදමින් අප දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් දිස්ත්‍රික්කවල ආගමික උත්සවයන් පැවැවීමට පියවර ගෙන තිබුනි

### 4.3.1 තෛපොංගල් උත්සවය

දිස්ත්‍රික්ක මට්ටමින් දෙපාර්මේන්තුවේ අනුග්‍රහයෙන් තෛපොංගල් උත්සවයන් කෝවිල්වල හා අරනෙරි දහම් පාසැල්වල පවත්වා ඇත.

*4 – I සටහන*

| අනු අංක | උත්සවය පවත්වන ලද දිස්ත්‍රික්කය | පවත්වන ලද ස්ථානය | සහභාගීවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොළඹ | හින්දු ආගමික සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ | 100 |
| 2 | මුලතිව් | හින්දු ආගමික සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ | 100 |
| 3 | කිලිනොච්චි | අරුල්මිගු කන්දසාමි දේවස්ථානය, කිලිනොච්චි<br>ශ්‍රී මහාදේව ආශ්‍රමය, කිලිනොච්චි | 100 |
| 4 | තෙල්ලිපලෛ | මල්ලාගම් පලම්පති අරනෙරි දහම් පාසැල | 100 |
| 5 | පුත්තලම් | තිල්ලයඩි මුරුගන් කෝවිල | 350 |
| 6 | මාන්දයි බටහිර | හින්දු යොවුන් මධ්‍යස්ථානය, මුන්ඩ්‍රාම්පිට්ටි,මන්නාරම | 50 |
| 7 | පස්සර | ශ්‍රී මුත්තුමාරියම්මන් දේවස්ථානය, පස්සර | 145 |
| 8 | වෙලනයි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වේලනයි | 85 |
| 9 | වෙංගලඩි | අම්මන් අරනෙරි දහම් පාසැල, වන්දාරුමූලෛ | 200 |
| 10 | මන්නාරම | ශ්‍රී මුත්තුමාරියම්මන් කෝවිල, මන්නාරම | 100 |

*රූප V*



ආරයම්පති අරනෙරි සිසුන් විසින් පවත්වන ලද තෛපොංගල් උත්සවය



පුදුකුඩියිරුප්පු හිදි පවත්වන ලද තෛපොංගල් උත්සවය



කිලිනොච්චි කන්දස්වාමි කෝවිලේදි පැවැත්වූ තෛපොංගල් උත්සවය



වවුනියා මුත්තුමාරි අම්මන් කෝවිලේදි පැවැත්වූ තෛපොංගල් උත්සවය

### 4.3.2 මහා ශිවරාත්‍රි උත්සවය

දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් මහා ශිවරාත්‍රි උත්සවය නිමිත්තෙන් විශේෂ පූජාවන් හා ආධ්‍යාත්මික වැඩසටහන් දිස්ත්‍රික්ක 8 පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වා ඇත.

*4 - II – සටහන*

| අනු අංකය | වැඩසටහන පැවැත්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මහනුවර | නිත්දවලයි ශ්‍රී මුත්තුමාරි අම්මන් කෝවිලේ විවේගානන්දා අරනෙරි දහම් පාසැල | **110** |
| 2 | වෙංගලඩි | ශ්‍රී මහා විශ්නු කෝවිල, වෙංකලඩි | **150** |
| 3 | ත්‍රිකුණාමලය | ශ්‍රී සොට්පගවල්ලි අම්මන් කෝවිල, කිලිවෙට්ටි | **105** |
| 4 | වවුනතීව් | **කොත්තියාපුලෙ ශ්‍රී මුදලයිමඩු පිල්ලයාර් කෝවිල** | 300 |
| 5 | නල්ලූර් | **තිරුනෙල්වේලි කාලියම්මන් කෝවිල** | 225 |
| 6 | උඩුවිල් | **කුප්පිලාන් වීරමුනෛ කන්නිමාර් අරනෙරි පාසැල** | 440 |
| 7 | වෙල්ලාවෙලි | **මුනෛතීවු ශ්‍රී විනායගර් අරනෙරි දහම් පාසැල** | 150 |
| 8 | ලුණුගල | **සෙල්ව විනායගර් කෝවිල** | 100 |
| 9 | බදුල්ල | ශ්‍රී සිත්තිවිනායගර් අරනෙරි දහම් පාසැල | 320 |
| 10 | මුලතිව් | **ආදි වෛරවර් කෝවිල** | 350 |
| 11 | කරාපොල | ශ්‍රී මුත්තුමාරියම්මන් කෝවිල, කරාපොල, පොලොන්නරුව | 150 |
| 12 | කරවෙඩ්ඩි | **කරුනයම්පදි අරුල්මිගු ශ්‍රී වාලාම්බිගා සමේද වෛතීස්වරර් ස්වාමි කෝවිල** | 145 |
| 13 | පොතුවිල් | **ඌරණි විනායගර් කෝවිල** | 300 |
| 14 | කිලිනොච්චි | **කමලාම්බිගෛ සමේද තායුමානවර් දේවස්ථානය, කිලිනොච්චි** | 225 |

| | | | |
|---|---|---|---|
| 15 | කොළඹ | **හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, හින්දු පරිලාන සභාව** | 200 |
| 16 | අම්පාර  නාවිදන්වෙලි | **පාමඩි ශ්‍රී සිත්තිවිනායගර් කෝවිල** | 200 |
| 17 | මඩකලපුව<br>වාගරයි | **පාටසේනයි, විනායගර් අරනෙරි පාසැල** | 120 |
| 18 | වාලයිචේනයි | **පේත්තාලෙල වීරයඩි විනායගර් අරනෙරි කෝවිල** | 320 |
| 19 | කිරාන් | ශ්‍රී මහා විශ්ණු කෝවිල, කිරාන් | 300 |
| 20 | කිලිනොච්චි | **උරුත්තිරිපුරම්, උරුත්තිරපුරීස්වරර් කෝවිල** | 230 |
| 21 | පට්ටිපලයි | **නාගලිංගේෂ්වරර් කෝවිල, මුනෛකාඩු** | 125 |
| 22 | තෙන්මරාඩ්චි | **ආදි විනායගර් කෝවිල, සාවකච්චේරි** | 350 |
| 23 | කිලිවෙඩ්ටි | ශ්‍රී සොට්පග වල්ලි අම්මන් කෝවිල, කිලිවෙට්ටි | 250 |
| 24 | ගාල්ල | නාකියාදෙනිය කොවිල | 150 |
| 25 | කාරයිතීව් | ශ්‍රී නන්දවන සිත්තිවිනායගර් කෝවිල | 125 |
| 26 | පුත්තලම | කොට්ටාරුමුල්ලෙල ශ්‍රී ගනේෂ්වරර් කෝවිල | 100 |

*රූප - VI*






බදුල්ලෙදි පැවැති මහා ශිවරාත්‍රි උත්සවයේදි දහම් පාසැල් සිසුන් විසින් ඉදිරිපත් කර ඇති කලා අංගයක්



මහනුවර නින්දවල ශ්‍රී මුත්තුමාරි අම්මන් කෝවිලේදි පැවැති මහා ශිවරාත්‍රි උත්සවයේදි අරනෙරි සිසුන් විසින් පවත්වන ලද කලා වැඩසටහන



යාපනය තිරුනෙල්වේලි ශ්‍රී කාලිඅම්මන් කෝවිලේදි පැවැති ශිවරාත්‍රී උත්සවයේදි අරනෙරි සිසුන් විසින් පවත්වන ලද කලා වැඩසටහන

### 4.3.3 අළුත් අවුරුදු උත්සවය

මෙම වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක අළුත් අවුරුදු උත්සවයන් සමරන ලදි.

*4 - III – සටහන*

| අනු අංක | අළුත් අවුරුදු උත්සවයන් පැවැත්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පවත්වන ලද ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කීරිමලෛ | නගුලේස්වරර් කෝවිල, කීරිමලෛ, යාපනය | 300 |
| 2 | වේලනයි | වංගලාවඩි මුරුගන් කෝවිල, වේලනයි | 200 |
| 3 | අගලවත්ත | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අගලවත්ත | 100 |
| 4 | පට්ටිපලෛ | කොක්ට්ටිචෝලෛ තාන්තෝන්ඊස්වරර් කෝවිල | |
| 5 | කොළඹ | හින්දු ආගමික කලා සංස්කෘතික මධ්‍යස්ථානය | |
| 6 | මහනුවර | හින්දු ඉලෛඥර් මන්ඩ්‍ර අරනෙරි දහම් පාසැල | |
| 7 | කොවිල්කුලම | අරල්මිගු අගිලාන්ඩෙස්වරර් කෝවිල | |
| 8 | බදුල්ල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බදුල්ල | |
| 9 | තෙල්ලිපලෛ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තෙල්ලිපලෛ | |
| 10 | ගාල්ල | නාකියාදෙණිය කෝවිල | |
| 11 | සෙගුවන්තීවු | හින්දු ඉලෛඥර් මන්ඩ්‍ර අරනෙරි දහම් පාසැල, සේගුවන්තීවු | |

රූප - **VI**





මෙම වර්ෂයේ පොන්නම්බලම් වානේෂ්වරර් කෝවිලේ පැවැති අළුත් අවුරුදු උත්සවයේදි

### 4.3.4 නව රාත්‍රි උත්සවය

දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් සැප්තැම්බර් මස 13 දින සිට ඔක්තෝබර් 22 දින දක්වා දිස්ත්‍රික්ක 10ක නවරාත්‍රි උත්සවයන් 23ක් පවත්වා ඇත. 2015.10.20 දින දෙපාර්තමේන්තුවේ හා පාර්ලිමේන්තුවේදි නවරාත්‍රි උත්සවය සමරන ලදි.

*4 - IV – සටහන*

| අනු අංක | නවරාත්‍රි උත්සවය පවත්වන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පැවැත්වන ලද ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මහනුවර | කටුකැලේ, සෙල්වවිනායගර් කෝවිල | 100 |
| 2 | වෙංකලඩි | ශ්‍රී මුත්තුමාරිඅම්මන් කෝවිල, වේප්පවට්ටුවාන් | 100 |
| 3 | ත්‍රිකුණාමලය | ශ්‍රී බාල මුරුගන් කෝවිල, පාලෛඌට්‍රා ත්‍රිකුණාමලය | 100 |
| 4 | වවුනතීව් | වවුනතීවු, මුරුගන් කෝවිල | 50 |
| 5 | නල්ලුර් | ශ්‍රී කාලියම්මන් කෝවිල, තිරුනෙල්වේලි | 100 |
| 6 | උඩුවිල් | සාලම්පයියන් අරනෙරි, මල්ලාගම් | 150 |
| 8 | ලුණුගල | ශ්‍රී මත්තුමාරියම්මන් කෝවිල | 100 |
| 9 | බදුල්ල | ශ්‍රී සිත්තිවිනායගර් අරනෙරි දහම් පාසැල, බදුල්ල | 100 |
| 10 | මුනෛතීවු | ආදි වෛරවර් කෝවිල, කල්ලපාඩු, මරුදිපට්ටු | 80 |
| 11 | කරාපොල | මන්නම්පිටි දමිළ මහා විද්‍යාලය | 100 |
| 12 | කරවෙට්ටි | ශ්‍රී වාලාම්බිගා සමේද වෛදීස්වරර් කෝවිල | 100 |
| 13 | පොතුවිල් | විනායගර් අරනෙරි පාසැල, පොතුවිල් | 55 |
| 14 | කිලිනොච්චි | උරුත්තිරපුරීස්වරර් කෝවිල, කිලිනොච්චිය | 100 |
| 15 | කොළඹ | උතුරු කොළඹ හින්දු පරිපාලන සභාව | 02 |
| 16 | අම්පාර, නාවිදන්වෙලි | කුබන්ඩි ශ්‍රී සිත්ති විනායගර් කෝවිල, සෙන්ට්‍රල් කෑම්ප් | 100 |
| 17 | මඩකලපු, වාගරෙ | මාංකේනි සිත්තිවිනායගර් කෝවිල, වාගරෙ | 180 |
| 18 | වාලයිචේනයි | ආරුමුග නාවලර් අරනෙරි දහම් පාසැල, මරුදනගර්, කල්මඩු | 60 |
